IHRA

UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - 2021/2022 (සිංහල මාධ්‍යය)**

**තෙවන වසර - දෙවන සෙමෙස්තර පරීක්ෂණය**

**(පවත්වන ලද්දේ අප්‍රේල් 2024)**

## BLM 3232 - සාහිත්‍ය විචාරය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

(2) සියලුම ප්‍රශ්න සඳහා සමාන ලකුණු හිමි වේ.

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) කාලය පැය තුනයි. (03)

(5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. "සාහිත්‍ය විචාරය යනු කිසියම් සාහිත්‍ය නිර්මාණයක අගය න්‍යායිකව විමසා බැලෙන ශාස්ත්‍රීය කාර්යයකි." විමසන්න.

(ලකුණු 20)

2. බටහිර සාහිත්‍ය විචාර ඉතිහාසය විමසීමේ දී ග්‍රීක සාහිත්‍ය යුගයෙහි වැදගත්කම සනිදර්ශනාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

3. "සාහිත්‍ය න්‍යාය වර්ධනය වී ඇත්තේ සමාජ විකාසනයට සමාන්තරව ය." මේ ප්‍රකාශයේ සත්‍යාසත්‍යතාව විමසන්න.

(ලකුණු 20)

4. "සාහිත්‍යික යථාර්ථවාදය යනු ඉන්ද්‍රියගෝචර යථාර්ථය සාහිත්‍යමය ස්වරූපයකින් ප්‍රතිනිර්මාණය කිරීමේ විධියකි." සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

5. "නූතනවාදී කලා න්‍යාය බිහි වූයේ නූතනත්වයට එරෙහි ප්‍රතිචාරයක් ලෙස ය." මේ ප්‍රකාශයේ වලංගු භාවය විමසන්න.

(ලකුණු 20)

6. "කොළඹ යුගයේ තරුණ පරපුරේ කවීන් රොමැන්තිකවාදය හඳුනාගත්තේ පටු අර්ථයකිනි." මේ මතයට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වමින් එය විවරණය කරන්න.

(ලකුණු 20)

7. මධ්‍යම පාන්තික ග්‍රාමීය සිංහල තරුණයෙකුගේ සමාජ පසුබිම හා චිත්තභ්‍යන්තරය විනිවිද දකින කෙටිකතාවක් ලෙස ගුණදාස අමරසේකරගේ ජීවන සුවඳ කෙටිකතාව සැලකිය හැකි දැයි විමසන්න.

(ලකුණු 20)

8. පහත දැක්වෙන මාතෘකා අතුරින් දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. රසවාදය

ii. ඇරිස්ටෝටල්

iii. මළවුන්ගේ අවුරුදු දා

iv. දෘෂ්ටිකෝණය

(ලකුණු 20)

****************************************

72

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය
## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - 2021/2022 (සිංහල මාධ්‍යය)**

**තෙවන වසර - දෙවන සෙමෙස්තර පරීක්ෂණය**

**(පවත්වන ලද්දේ අප්‍රේල් 2024)**

## BLM 3233 – කළමනාකරණ තොරතුරු පද්ධති

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සැපයිය යුතුයි.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව විභාගශාලාධිපතිට දැනුම් දෙන්න.

1.

A. දත්ත සහ තොරතුරු (data and information) අතර වෙනස උදාහරණයක් සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

B. මානව සංවර්ධනයේ අවධීන්හිදී (stages of human development) තොරතුරු වල බලපෑම (impact of information) පැහැදිලි කරන්න.

(ලකුණු 12)
(මුළු ලකුණු 20)

2.

A. පද්ධතියක් යනු කුමක්ද? උදාහරණ 03ක් දක්වන්න.

(ලකුණු 08)

B. පරිගණක පාදක තොරතුරු පද්ධතියක ප්‍රධාන සංරචක (computer-based information system) සහ එහි ක්‍රියාකාරීත්වය පැහැදිලි කරන්න.

(ලකුණු 12)
(මුළු ලකුණු 20)

3.

A. එක් එක් පද්ධතියේ ප්‍රධාන ක්‍රියාකාරීත්වයන් (functionalities) වෙන්කර හඳුනාගත හැකි ආයතනික ධූරාවලියකට (organizational hierarchy) එරෙහිව පරිගණක පාදක තොරතුරු පද්ධති (computer-based information systems) වර්ග පැහැදිලි කරන්න.

(ලකුණු 08)

B. ව්‍යාවසාය සම්පත් සැලසුම් පද්ධතියක කාර්යභාරය (Enterprise Resource Planning)සහ ක්‍රියාකාරීත්වය (functionalities) පැහැදිලි කරන්න.

(ලකුණු 12)
(මුළු ලකුණු 20)

4.

A. තරඟකාරී වාසි ලබා ගැනීම(Competitive Advantage) සඳහා සංවිධානයකට කළමනාකරණ තොරතුරු පද්ධති (Management Information Systems) භාවිතා කළ හැකි ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

B. කළමනාකරණ තොරතුරු පද්ධති හා සම්බන්ධ කළමනාකරණ ගැටළු(management issues) පැහැදිලි කරන්න.

(ලකුණු 12)
(මුළු ලකුණු 20)

5.

A. රූප සටහනක් භාවිතයෙන් e-ව්‍යාපාර ආකෘති (E-Business models) ලැයිස්තුගත කරන්න.

**(ලකුණු 08)**

B. අලෙවිකරණ මිශ්‍රණය(Marketing Mix) සඳහා අන්තර්ජාලය (internet) භාවිතා කළ හැකි ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

**(ලකුණු 12)**
**(මුළු ලකුණු 20)**

6.

A. ආගන්තුක සත්කාර කර්මාන්තයේ(Hospitality Industry) උදාහරණයක් භාවිතා කරමින් ව්‍යාපාරික බුද්ධිය (Business Intelligence) පිළිබඳ සංකල්පය (concept) විස්තර කරන්න.

**(ලකුණු 08)**

B. ව්‍යාපාර බුද්ධියේ වාසි සහ අවාසි පැහැදිලි කරන්න.

**(ලකුණු 12)**
**(මුළු ලකුණු 20)**

********************************

IHRA
UNIVERSITY OF COLOMBO

**මානව සම්පත් අභිවර්ධන ආයතනය**

**කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව -**

**ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - 2021/2022 (සිංහල මාධ්‍යය)**

**තෙවන වසර දෙවන සෙමෙස්තර පරීක්ෂණය –පවත්වන ලද්දේ (අප්‍රේල් 2024)**

**BLM 3234- Contemporary Issues in Labour Markets**

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. 'විශේෂයෙන් COVID-19 වසංගතයෙන් පසු ශ්‍රම වෙළඳපොලේ බොහෝ වෙනස්කම් සිදු වෙමින් පවතින අතර එවැනි වෙනස්කම් වලට ප්‍රතිචාර වශයෙන් ආමන්ත්‍රණය කළ යුතු බොහෝ වර්ධනයන් ද සිදුව ඇත'.

I. ශ්‍රම වෙළඳපලේ වර්තමාන ප්‍රවණතා සහ අදාළ දත්ත ඇසුරෙන් ඉහත ප්‍රකාශය පැහැදිළි කරන්න

(ලකුණු 10)

II. ඉහත ප්‍රවණතාවයට මුහුණ දීම සඳහා සුදුසු ප්‍රතිපත්ති සහ යෝජනා ඉදිරිපත් කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

2. 'ළමා ශ්‍රමය වඩාත් වැදගත් ලෙස සලකනු ලබන අතර විවිධ සන්දර්භයන් තුළ සංකීර්ණ ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇත්තේ එම සංදර්භයන් තුළ පවතින විවිධ සංස්කෘතික සහ දේශපාලනික කරුණු නිසාය'.

i. ළමා ශ්‍රමය භාවිතා කිරීමේ ආර්ථික හා සමාජීය ප්‍රතිවිපාක සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ii. ළමා ශ්‍රමය පිළිබඳ ගැටළු කළමනාකරණය කිරීම සඳහා ඔබ යෝජනා කළ හැකි සන්දර්භ විශේෂිත (Context- Specific) යෝජනා සහ උපාය මාර්ග සාකච්ඡා කරන්න

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

3. 'සංචරණ සීමා හේතුවෙන් COVID-19 වසංගතය අතරතුර ශ්‍රම සංක්‍රමණය ප්‍රධාන සැලකිල්ලක් දක්වා ඇති අතර පශ්චාත් වසංගත කාලය තුළ බොහෝ වෙනස්කම් දක්නට ලැබේ.'

i. ශ්‍රම වෙළඳපොළ ආශ්‍රිත ගැටළු සඳහා ශ්‍රම සංක්‍රමණය බලපාන ආකාරය හඳුනා ගන්න.

(ලකුණු 10)

ii. විවිධ ආකාරයේ ශ්‍රම සංක්‍රමණ හඳුනා ගන්න. ඒවා උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

4. 'කලාපීය ශ්‍රම වෙළඳපොල වෙනස් වීම බොහෝ විද්වතුන් විසින් ප්‍රධාන විගමන ගැටළුවක් ලෙස පිළිගෙන ඇත'.

i. ඉහත ප්‍රකාශය සම්බන්ධයෙන් බටහිර ශ්‍රම වෙළඳපොළ තුළ දකුණු ආසියාතික සංක්‍රමණිකයන් මුහුණ දෙන ගැටළු සාකච්ඡා කරන්න.

**(ලකුණු 10)**

ii. ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ තුළ චීන හා ඉන්දියානු ශ්‍රමය භාවිතා කිරීමේ ප්‍රතිවිපාක ඇගයීමට ලක් කරන්න.

**(ලකුණු 10)**
**(මුළු ලකුණු 20)**

5. "ආයතන ශ්‍රම විගමනය (Expatriation) පිළිබඳ අවධානය යොමු කළද ශ්‍රම ආගමනය (Repatriation) පිළිබඳව අවධානයක් යොමු නොකරයි".

i. ශ්‍රම වෙළඳපොළ තුළ සේවය කරන විදේශ සංක්‍රමණිකයන්ට අදාළ ගැටළු පිළිබඳව සාකච්ඡා කරන්න.

**(ලකුණු 10)**

ii. විදේශ සංක්‍රමණිකයන්ගේ සේවය නිමවී නැවත ආපසු හරවා යැවීමේ ක්‍රියාවලියේ වැදගත්කම පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**
**(මුළු ලකුණු 20)**

6. පහත දැක්වෙන කෙටි සටහන් ලියන්න.

i. ළමා ශ්‍රමයේ සමාජ බලපෑම අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග
ii. රැකියාවේදී කාන්තාවන් මුහුණ දෙන ගැටළු
iii. රැකියාවේ දී ඉහත පිළිගත් ගැටළු කළමනාකරණය කිරීම සඳහා යෝජනා
iv. වැඩ සැකසුම තුළ පිරිමින්ට එරෙහිව හිරිහැර වීමේ අවස්ථා පැහැදිලි කරන්න
v. රැකියාවේදී පිරිමින්ට එරෙහි හිරිහැර අවම කිරීම සඳහා උපාය මාර්ග

**(ලකුණු 04 බැගින්)**
**(මුළු ලකුණු 20)**

**********************************

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

### ශ්‍රම කළමනාකරණවේදී උපාධි පරීක්ෂණය - 2021/2022 (සිංහල මාධ්‍යය)

**තෙවන වසර - දෙවන සෙමෙස්තර පරීක්ෂණය**

**(පවත්වන ලද්දේ අප්‍රේල් 2024)**

## BLM 3235 - විගණනය හා බඳුකරණය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න පහකින් (05) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(3) කාලය පැය තුනයි. (03)

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

**ප්‍රශ්නය 1**

සහතික කිරීමේ කාර්යභාරයක(Assurance Engagement) පරමාර්ථය වන්නේ තොරතුරු අපේක්ෂිත පරිශීලකයින්ට සහතිකවීමක් ලබා දීමයි. සාධාරණ සහතිකවීමක් ලබාදෙන කාර්යභාර (Reasonable Assurance Engagement) සහ සීමිත සහතිකවීමක් ලබාදෙන කාර්යභාර (Limited Assurance Engagement) ලෙස සහතිකවීමේ කාර්යභාර වර්ග දෙකකි..

1. විගණන සහතිකවීමේ කාර්යභාරයකදී ((Audit assurance engagement සේවාදායක සමාගම (Client Company) කොටස් හිමියන් (Shareholders) සහ විගණක (Auditor) අතර ඇති සම්බන්ධය පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

2. මූල්‍ය විගණනයකදී මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් සම්පූර්ණ සහතික වීමක් (Absolute assurance) ලබා දිය නොහැකි වන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**
**(මුළු ලකුණු 10)**

**ප්‍රශ්නය 2**

රුක්මන් ඇසෝසියේට් (RA) යනු ජ්‍යෙෂ්ඨ සේවකයන් දෙදෙනෙකු හා කණිෂ්ඨ සේවකයින් පස් දෙනෙකුගෙන් සමන්විත වන විගණන ආයතනයකි. 2017 වසරේ සිට HTP Freight Services (PVT) Ltd (HTP) ආයතනයේ විගණන ආයතනය ලෙස RA කටයුතු කරයි. 2017 වසරේ සිට HTP විගණන කාර්යභාරයේ කාර්යභාරබාර හවුල්කරු (Engagement Partner) ලෙස රුක්මන් මහතා කටයුතු කරන සමන් මහතා අතර පසුගිය වසර තුනෙහි විගණනයභාර ජ්‍යෙෂ්ඨ සාමාජිකයා විය. HTP සමාගමෙහි අධ්‍යක්ෂවරුන් විසින් සමාගමෙහි හිමිකම් උපකරණ අගය තක්සේරුව (Valuation of equity instruments) පිළිගන්නා ලෙස ඉල්ලා සිටියහ. RA හි මුළු ආදායමෙන් 35% කට ආසන්න ප්‍රමාණයක් HTP ආයතනයට සපයන ගිණුම්කරණ හා විගණන සේවාවන් වලින් උපයන බැවින් සේවාදායකයාගේ ඉල්ලීම ප්‍රත්ක්ෂේප කිරීමට අපහසු බව රුක්මන් මහතා අනාවරණය කර ගන්නා ලදි.

i. ආචාරධර්මවල මූලික මූලධර්මවලට (Principles of the code of ethics) අනුගත වීමේදී RA ට අදාළ වන තර්ජන (Threats) තුනක් පැහැදිලි කරන්න ඉහත සිද්ධිය ඇසුරෙන )03)

**(ලකුණු 05)**

ii. ආචාර ධර්මවල මූලික මූලධර්ම වලට ඇති තර්ජන අවම කිරීම සඳහා RA විසින් ක්‍රියාත්මක කළ හැකි ආරක්ෂණ (Safeguards) තුනක් (3) සඳහන් කරන්න.

**(ලකුණු 03)**

iii. අභ්‍යන්තර පාලන පද්ධතියක (Internal control system) කොටස් ) Componet(හතරක් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

iv. අභ්‍යන්තර පාලන පද්ධතියක (Internal control system) අරමුණු(Purposes) තුනක් හඳුනා ගන්න.)

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්නය 3**

නව විගණන සේවාදායකයෙකු වන Roy Hotels (Pvt) Ltd. (RHL) හි විගණන කළමනාකරු ලෙස විමල් මහතා පත්කර ඇත. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා RHL හි මූල්‍ය ප්‍රකාශන විගණනය ලබන මාසයේ ආරම්භ කිරීමට නියමිත බවත් මේ වන තෙක් කිසිවක් සිදු කර නොමැති බවත් විගණනයභාර හවුල්කරු වන ශිවා මහතා දන්වා සිටියේ ය.

i. විගණනය ආරම්භ කිරීමට පෙර ඉහත මූලික විගණනයට අදාළව විමල් විසින් සිදු කළ යුතු විශේෂිත ක්‍රියා පටිපාටි (Specific procedures) දෙකක් (2) පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ii. විගණන අවදානම සංරචක( Audit risk Components) හඳුනාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. ප්‍රමාණාත්මකබව( Materiality) සඳහා මිණුම් ලකුණ (Benchmark ) තීරණය කිරීමේදී සලකා බැලිය යුතු සාධක තුනක් හඳුනා ගන්න.

(ලකුණු 03)

iv. විමල් විසින් තීරණය කරන ලද මිණුම් ලකුණ (Benchmark )අයභාරය (Revenue) ලෙසත් සහ මූල්‍ය ප්‍රකාශන කෙටුම්පතෙහි ( Draft F/Sඅයභාරය රු .100,000,000 ක් බවත් උපකල්පනය කරන්න. තවද, විගණන අවදානම සාමාන්‍යයයැයි (Normal) උපකල්පනය කෙරේ. ඉහත තොරතුරු මත පදනම්ව, සුදුසු අනුපාත (Ratios/Percentages) භාවිතයෙන් ප්‍රමාණාත්මකභවේ මට්ටම් තුන(Three Levels of Materiality) ගණනය කරන්න. තවද, විගණනයේදී එක් එක් ප්‍රමාණාත්මකභවේ මට්ටම් වල භාවිතයන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්නය 4**

අමින්, Local Retailers Ltd ආයතනයේ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන විගණනය කරන විගණන කණ්ඩායමේ සාමාජිකයෙකි. එහි ප්‍රධාන කාර්යාලය කොළඹ බද්ද පදනම මත ලබා දී ඇති ගොඩනැගිල්ලක පවතින අතර කුලිය කාර්තුමය වශයෙන් කල්තබා ගෙවිය යුතුය.

i. Local Retailers Ltd ආයතනයේ කුලී වියදමට (Rent expense) අදාළ වන විගණන සැඳහුම් Audit assertions) තුනක් (3) පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ii. කුලී වියදම් සම්බන්ධයෙන් ඉහත සැඳහුම් (Assertions ) සත්‍යාපනය කිරීම (Verify) සඳහා සිදු කළ හැකි විගණන ක්‍රියා පටිපාටි (Audit procedures) තුනක්(3) පැහැදිලි කරන්න.

(ලකුණු 06)

iii. පාලන පරීක් (Tests of Controls ) සහ තහවුරු ක්‍රියා පටිපාටි (Substantive procedures) අතර වෙනස හඳුනා ගන්න.

(ලකුණු 04)

iv. විගණන ක්‍රියා පටිපාටියක් (Audit procedure) සැලසුම් කිරීමේදී සලකා බැලිය යුතු සාධක (Characteristics/Considerations) දෙකක් (2) පැහැදිලි කරන්න.

(ලකුණු 4)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්නය 5**

අමල් මහතා ශෝබා පොදු සමාගමෙහි ගණකාධිකාරීවරයෙකු ලෙස සේවය කරයි. එමෙන්ම ඔහු තමන්ගේම ව්‍යාපාරයක් වන අමල් කන්සල්ටන්සි ආයතනය ද කරගෙන යනු ලබයි.

2023/24 තක්සේරු වර්ෂය (Year of Assessment) සඳහා ඔහුගේ රැකියාවෙන් ලබාගත් ඉපැයීම් (Earnings from employment) පහත පරිදි වේ.

i. 24/2023 වසර සඳහා වැටුප ලෙස 8%ක සේවක අර්ථ සාධක අරමුදල )EPF (සඳහා අඩු කිරීමෙන් පසු රු .1,380,000 ක් ලැබුණි.

ii. අමල් මහතා සඳහා සේවක අර්ථ සාධක අරමුදල (EPF) සහ සේවක භාරකාර අරමුදල (ETF) සඳහා සමාගමේ දායකත්වය පිළිවෙලින් රු .180,000 ක් සහ රු .45,000 කි.

iii. මීට අමතරව, 2024 මාර්තු මාසයේදී ඔහුට රු .200,000 ක ප්‍රසාද දීමනාවක් ලැබිණි.

iv. රැකියාවේ ගමන් වියදම් සඳහා ඔහුට රුපියල් 25,000 ක ප්‍රතිපූරණයක් (Reimbursement) ලැබී ඇත.

v. 2023/24 තක්සේරු වර්ෂය තුළ අඩු කරන ලද අත්තිකාරම් පුද්ගලික ආදායම් බද්ද ( APIT) රු . 300,000 කි.

ඔහුගේම ව්‍යාපාරයක් වන අමල් කන්සල්ටන්සි ආයතනයේ මූල්‍ය තොරතුරු පහත පරිදි වේ.

i. 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ව්‍යාපාරයේ ගිණුම්කරණ ලාභය 5,400,000 කි.

ii. වෘත්තිකයන්ගේ දැනුම යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා වූ සාමාන්‍ය ආකාරයේ පුහුණුවක් සඳහා රු20,000 ක මුදලක් වැය කර ඇත. මෙය සෘජුවම ව්‍යාපාරයට අදාළ වේ
තවද අමල්ගේ ශාස්ත්‍රපති උපාධිය සඳහා ව්‍යාපාරය විසින් රු150000 ක මුදලක් වැය කර ඇත.

iii. ව්‍යාපාරය කාර්යාල උපකරණ ප්‍රවාහනය සඳහා ලොරි රථයක් 22.09.2021 දින රු .3,000,000 ක මුදලකට අත්පත් කරගෙන ඇත. ලොරි රථය වසර 5ක් භාවිතා කළ හැකි ය .

iv. ව්‍යාපාරය විසින් 15.03.2018 දින රු .5,000,000 ක් වටිනා ගොඩනැගිල්ලක් අත්පත් කරගෙන ඇත. ගොඩනැගිල්ලේ ආයු කාලය වසර 25 කි.

v. 01.01.2024 දින රු. 200,000 කට පරිගණකයක් මිලදී ගෙන ඇති අතර පරිගණකයේ ආයු කාලය වසර 4 කි.

vi. ව්‍යාපාරය ලාභය ගණනය කිරීමේදී පහත සඳහන් වියදම් අඩු කර ඇත.

අ. වර්ෂය සඳහා අඩමාන ණය ප්‍රතිපාදන (Provision for doubtfuldebt ) රු30,000 කි

ආ. බොල් ණය (Bad debt) .රු55,000 කි

vii. ලාභය ගණනය කිරීමේදී රු100,000 ක පරියේෂණ වියදමක් (Research Expense) අඩු කර ඇත000,.තව ද රු .300 ක් වූ සංවර්ධන පිරිවැයක් (Development cost) ප්‍රාග්ධනික(Capitalize ) කර ඇත.

viii. 2023/24 තක්සේරු වර්ෂය තුළ ව්‍යාපාරයට රු .80,000 ක දළකුලී ආදායමක්Gross Rent Income ) ලැබී ඇත.

එය ලැබුණ විට, 10% ක රඳවා ගැනීමේ බද්දක් (WHT) අඩු කර ඇත.

ix. ව්‍යාපාරය විසින් අනුමත පුණ්‍යායතනයකට (Approved Charity) රු120,000 ක මුදල් පරිත්‍යාගයක් (Donation) කර ඇත.

ඊට අමතරව අමල් පළමු කාර්තු තුන සඳහා ස්වයං තක්සේරු ගෙවීම් (Self Assessment Payments) ලෙස රු. 535,000 ක මුදලක් ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ:

2023/24 තක්සේරු වර්ෂය සඳහා අමල්ගේ ආදායම් බද්ද (Income Tax) සහ ගෙවිය යුතු ශේෂ බද්ද/ ආපසු ගෙවීම (Balance Income Tax Payable/Refund) ගණනය කරන්න.

(මුළු ලකුණු 30)

****************************************